**රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 30 - 2022**

**-------------------------------------------------------------------**

**1. විගණන මතය**

1.1 රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 30ක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන හා මුදල් ප්‍රවාහ ප්‍රකාශන, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 30කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 30හි තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇති අතර, තත්ත්වාගණනය කළ මතය සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති ඇතුළුව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | කාරක සභාව/කාරක සභා | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ඇහැලියගොඩ, ගොඩකවෙල, අම්බැවිල, වැලිගෙපොල, පඹහින්න, අයගම, රාස්සගල | ක්ෂය ප්‍රතිශත මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේ දී හෙළිදරව් කිරීමට කටයුතු කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | දාමහන, මාරපන, දොඩම්පෙ, බඹරබොටුව, නිවිතිගල | අලෙවි කළ නොහැකි පිළිවෙලින් රු. 267,633ක, රු. 72,897ක හා රු. 22,916ක තොග සහ පිළිවෙලින් රු. 63,112ක හා රු. 1,678,389ක ව්‍යාජ වත්කම් ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | කොමසාරිස් අනුමැතිය ලබාගෙන පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව | විධිමත් අනුමැතීන් යටතේ ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | කාරක සභා | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රත්මලවින්න, ඇහැලියගොඩ, අයගම | එකතුව රු. 153,478ක ලැබිය යුතු ශේෂ 03ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | ගොඩකවෙල | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ගිණුම් විෂයයන් 02ක අවසාන ශේෂ හා සමාලෝචිත වර්ෂයේ ලෙජරයේ සටහන් කර ඇති ආරම්භක ශේෂ අතර රු. 121,306ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ගිලීමලේ | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. 126,389ක තොගයක් භෞතිකව නොපැවතිණි. | තොග නිරවුල් කිරීමට නියෝජ්‍ය කොමසාරිස් වෙත ලිපි හා වාර්තා ඉදිරිපත් කර ඇති බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) | ඇඹිලිපිටිය | වර්ෂ කිහිපයක් පැරණි රු. 78,243ක හා 2021 වර්ෂයේ දී ලද රු. 600,000ක පොහොර තොග අස්ථානගත වී තිබුණි. | මේ වන තෙක් ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳ දැනුවත් කර නොමැති බව සහ රු. 78,243ක තොග වටිනාකම අයකර ගැනීමට ලිපි යොමු කර ඇතත් මේ වන විටත් අය වී නොමැති බව. | කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | පැල්මඩුල්ල | මැණික් බලපත්‍ර ඇප ලෙස රු. 4,127,000ක් දක්වා තිබුණ ද, එම ඇප තැබූ පාර්ශව පිළිබඳ | මේ වන විට ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීන කරන බව. | කඩිනමින් ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීන කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | | |
| (ඊ) | පැල්මඩුල්ල | ශේෂ පත්‍රයේ ඇතුළත් රු. 2,861,789ක් වූ ගිණුම් විෂයයන් 21ක් සඳහා ලෙජරයේ ගිණුම් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (උ) | රාස්සගල | සමුච්චිත අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 1,510,872ක් වුවද, ඒ සඳහා ලෙජර් ගිණුමක් නොතිබුණි. | වටිනාකම සනාථ කිරීමට ගිණුම් පිළියෙල කර නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඌ) | රාස්සගල | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පැවති එකතු කිරීම් දෝෂ නිසා පිළිවෙලින් වර්ෂයේ අතිරික්තය රු. 31,988කින් හා ශුද්ධ වත්කම් රු. 2,583,215කින් වැඩි වී තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (එ) | රාස්සගල | ඒකාබද්ධ වාර්තාව අනුව ගිණුම් විෂයයන් 06ක 2022 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂය හා එදිනට මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය අතර රු. 1,116,968ක වෙනසක් පැවතිණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඒකාබද්ධ වාර්තාවත් නිවැරදිව තබා ගත යුතුය. |
| (ඒ) | රත්මලවින්න, ගොඩකවෙල, වැලිගෙපොල, කිරිඇල්ල, රාස්සගල | එකතුව රු. 4,746,006ක වටිනාකමකින් යුත් ගිණුම් විෂයයන් 07ක් සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කර නොතිබුණි. | බැංකු ශාඛාවලින් ලබාගත් තොරතුරු මත පොළිය ගිණුම්ගත කළ බව හා ගිණුම්ගත කර නොතිබුණු ශේෂ ඉදිරි වර්ෂයේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඔ) | ඇහැලියගොඩ, ගිලීමලේ, වැලිගෙපොල, නිවිතිගල, කහවත්ත, නාමල්දෙණිය | එකතුව රු. 17,318,267ක වටිනාකමින් යුත් ජනල් වවුචර් 143ක් පිළියෙල කර අනුමත කර නොතිබුණි. | ඉදිරියේ දී ජනල් සටහන් පිළියෙල කර ඊට අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා බව. | ජනල් සටහන් සඳහා අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඕ) | පොතුපිටිය | 2014 වර්ෂයේ සිට අඛණ්ඩව ඉදිරියට ගෙන එනු ලබන රු. 246,370ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය සහ 2015 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එනු ලබන 35,241ක නොවිසඳුණු ශේෂයක් තිබුණි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට උපදෙස් දී ඇති බව සහ නොවිසඳුණු ශේෂ විසඳා ගැනීමට කටයුතු කරන බවත්ය. | අවිනිෂ්චිත ගිණුම් නිරවුල් කළ යුතු අතර, නොවිසඳුණු ගිණුම් ශේෂ විසඳා ගැනීමට කටයුතු කළ යුතු බවත්ය. |
| (ක) | බඹරබොටුව | ණයගැති උපලේඛනය අනුව ලැබිය යුතු පොළිය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ලැබිය යුතු පොළී ආදායම අතර රු. 1,647,507ක වෙනසක් පැවැතිණි. | පිළිතුරු ලබා දී නොමැත | ණයගැති උපලේඛන නිවැරදිව තබා ගත යුතුය. |

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

| | කාරක සභා | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රත්මලවින්න, ඇලපාත, අම්බැවිල, වැලිගෙපොල, පඹහින්න, කිරිඇල්ල, කල්තොට, බඹරබොටුව, පැල්මඩුල්ල, කුරුවිට, රාස්සගල | අවස්ථා 98ක දී සිදු කළ රු. 11,411,427ක ගෙවීම් තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි නොවුණි. | ඉදිරියේ දී අවශ්‍ය ලේඛන යාවත්කාලීනව ඉදිරිපත් කරන බව | අදාළ ලේඛන යාවත්කාලීන කර ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | කුරුවිට | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වූ ලැබිය යුතු පොළී රු. 258,567ක් සම්බන්ධයෙන් අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අදාළ ලේඛන නිවැරදිව තබා ගත යුතුය. |
| (ඇ) | රාස්සගල | ස්ථාවර වත්කම්වල රු. 1,666,015ක් වූ පිරිවැය ලබාගත් ආකාරය පිළිබඳ තොරතුරු කිසිවක් ඉදිරිපත් නොවුණි. | වත්කම වෙන වෙනම හඳුනා ගැනීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් නිවැරදිව වෙන් වෙන් වශයෙන් දැක්විය යුතු බව. |

### 1.3.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| කාරක සභාව/ කාරක සභා | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| ඕපනායක | පොහොර ජංගම ගිණුම | 226,327 | 46,644 | 179,683 | පරීක්ෂණ කටයුතු සඳහා ප්‍රධාන කාර්යාල භාරයට ගෙන ඇති බව. | කඩිනමින් පරීක්ෂණ කටයුතු සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.3.5 අවිනිශ්චිත ගිණුම්

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අම්බැවිල, වැලිගෙපොල, පනාමුර, දාමහන, තිඹොල්කැටිය, ඇඹිලිපිටිය | දීර්ඝ කාලයක සිට පැවත එන හර ශේෂ එකතුව රු. 109,811ක් හා බැර ශේෂ එකතුව රු. 35,667ක් විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අවිනිශ්චිත ගිණුම් නිරවුල් කළ යුතුය. |

## 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | කාරක සභාව/ කාරක සභා | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | රත්මලවින්න, කළවාන, ඇලපාත, ඕපනායක, ගිලීමලේ, රත්නපුර, පොතුපිටිය, කිරිඇල්ල, බඹරබොටුව, මාරපන, දොඩම්පෙ, නිවිතිගල, අයගම, කහවත්ත, පැල්මඩුල්ල, නාමල්දෙණිය, කුරුවිට | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත 30 වගන්තිය | වගා කළ හැකිව තිබූ එකතුව අක්කර 4191ක වපසරියක් සහිත කුඹුරු ඉඩම් ප්‍රමාණයක් පුරන්ව තිබුණි. | ඉදිරියේ දී කුඹුරු ඉඩම් අස්වැද්දීමට කටයුතු කරන බව | පනතේ 30 වන වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | රත්මලවින්න, ඕපනායක, ගිලීමලේ, පොතුපිටිය, පනාමුර, කිරිඇල්ල, බඹරබොටුව, මාරපන, දොඩම්පෙ, නිවිතිගල, අයගම, කහවත්ත, පැල්මඩුල්ල, රාස්සගල | 56 (1) වගන්තිය | 2022 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 1,908,012ක හිඟ අක්කර බදු ශේෂයක් පැවතුණි. | දීර්ඝකාලීනව අය නොවන ශේෂය කපා හැරීමට අනුමැතිය ඉල්ලා ඇති බවත්, හිඟ බදුවලින් කොටසක් අය වී ඇති බවත්, ඉතිරි මුදල් සැලසුම් සහගතව අයකර ගැනීමට කටයුතු කරන | පනතේ 56(1) අනුව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | බව. | |
| (ඇ) | කොලොන්න, ඇලපාත, ගොඩකවෙල, ගිලීමලේ, රත්නපුර, පොතුපිටිය, පනාමුර, පල්ලෙබැද්ද, ඇඹිලිපිටිය, බඹරබොටුව, දොඩම්පෙ, නිවිතිගල | 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ චක්‍රලේඛය | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව, දීර්ඝ කාලයක සිට පැවත එන 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කාමර කුලී රු. 1,269,239ක් විය. | හිඟ කාමර කුලීවලින් කොටසක් දැනටමත් අය වී ඇති බවත්, දීර්ඝකාලීනව තොරතුරු නොමැති ශේෂ කපා හැරීමට අනුමැතිය ඉල්ලා ඇති බවත්, ඉතිරි ශේෂ සැලසුම් සහගතව ඉදිරියේ දී නිරවුල් කිරීමටත් කටයුතු කරන බවත්ය. | කාමර කුලී චක්‍රලේඛය අනුව අයකර ගත යුතු ය. |
| (ඈ) | කොලොන්න, ඇහැලියගොඩ, කළවාන, ඇලපාත, ගිලීමලේ, පොතුපිටිය, වැලිගෙපොල, පනාමුර, කිරිඇල්ල, බඹරබොටුව, මාරපන, දොඩම්පෙ, නිවිතිගල, අයගම, කහවත්ත, කුරුවිට | 2020 ජූනි 25 දිනැති අංක 08/2020 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | අවශ්‍ය රජයේ නිලධාරීන් විසින් ඇප තැබීම් සිදුකර නොතිබුණි. | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත අනුව සහ දිස්ත්‍රික් කාර්යාලයේ උපදෙස් මත ඇප තැබීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ගොවිජන සේවා කාරක සභා 12ක ශුද්ධ මෙහෙයුම් වර්ධනය රු.4,591,397ක් හා ගොවිජන සේවා කාරක සභා 18ක ශුද්ධ මෙහෙයුම් පිරිහීම රු.4,352,411ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රත්මලවින්න, ඇහැලියගොඩ, ඕපනායක | රු. 9,569,101ක ශේෂයක් වැඩි පොළී ආදායමක් උපයා ගත හැකි පරිදි ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කර නොතිබුණි. | ඉදිරියේ දී ආයෝජනය කිරීමට කටයුතු කරන බව. | වැඩි පොලී ආදායමක් උපයාගත හැකි ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොලොන්න, ඇහැලියගොඩ, ඇලපාත, ගොඩකවෙල, පොතුපිටිය, පනාමුර, දාමහන, පල්ලෙබැද්ද, තිඹොල්කැටිය, ඇඹිලිපිටිය, බඹරබොටුව, මාරපන, නිවිතිගල, අයගම, කහවත්ත, කුරුවිට | මධ්‍යස්ථානයේ අයිතිය පවරාගෙන නොතිබුණි. | මධ්‍යස්ථාන අයිතිය පවරා ගැනීම සඳහා අදාළ ඉඩම පිළිබඳ විස්තර දිස්ත්‍රික් කාර්යාලය හරහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ඉදිරිපත් කර ඇති බව. | මධ්‍යස්ථානයේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඇහැලියගොඩ | දිස්ත්‍රික් කාර්යාලයේ අළුත්වැඩියා වෙනුවෙන් 2021 හා පෙර වර්ෂවල දරන ලද රු. 1,411,492ක මුදල අයකරගෙන නොතිබුණි. | අයවිය යුතු ශේෂ යටතේ ඇතුළත් කර ඇති බව. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | කල්තොට | 2010 වර්ෂයේ සිට පැවත එන එකතුව රු. 4,259,209ක ගිණුම් ශේෂ, පරීක්ෂණ කටයුතු අවසන් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | තොරතුරු සොයාගත නොහැකි බවත්, ගිණුම් නිරවුල් කිරීමට උපදෙස් ලබා ගැනීමට බලාපොරොත්තු වන බවත්. | පරීක්ෂණ කටයුතු අවසන් කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| රත්මලවින්න, කොලොන්න, ඇහැලියගොඩ, කළවාන, ඇලපාත, ඕපනායක, ගොඩකවෙල, අම්බැවිල, ගිලීමලේ, රත්නපුර, පොතුපිටිය, වැලිගෙපොල, පනාමුර, දාමහන, පල්ලෙබැද්ද, තිඹොල්කැටිය, ඇඹිලිපිටිය, පඹහින්න, කිරිඇල්ල, කල්තොට, බඹරබොටුව, මාරපන, දොඩම්පෙ, නිවිතිගල, අයගම, කහවත්ත, පැල්මඩුල්ල, නාමල්දෙණිය, කුරුවිට | දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 23,884,247ක් වූ ණයගැති ශේෂ 402ක් හා එකතුව රු. 27,487,529ක් වූ ණයහිමි ශේෂ 417ක් 2022 දෙසැම්බර් 31 දින වන විට අයකර ගැනීමටත්/ නිරවුල් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය උපදෙස් ලබාගෙන මෙම ශේෂ නිරවුල් කිරීමට හා තොරතුරු සනාථ කර ගැනීමට නොහැකි වීම මත පවතින ශේෂ කපා හැරීමට කටයුතු කිරීමටත්, අනෙකුත් ශේෂ පිළිබඳ සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව. | හිඟහිටි ණය ශේෂ නොපමාව අයකර ගැනීමටත්, ණයහිමි ශේෂ නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල ,පිරියත හා උපකරණ**

| | කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොලොන්න, ඇඹිලිපිටිය, පඹහින්න, කිරිඇල්ල, තිඹොල්කැටිය | වර්ෂ 07 සිට වර්ෂ 20 දක්වා කාලයක සිට නිල නිවාස 05ක් නිෂ්කාර්යව පැවැතිණි. | නිල නිවාස අළුත්වැඩියා කිරීමට කටයුතු යොදා ඇති බවත්, නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් අනුව කටයුතු කරන බව. | නිල නිවාස අලුත්වැඩියා කර භාවිතයට ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඇහැලියගොඩ, නාමල්දෙණිය | අක්‍රියව පවතින පොහොර ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට පිළිවෙලින් රු. 439,415ක හා රු. 51,929ක ශේෂයක් පැවැතිණි. | වර්ෂ ගණනාවක සිට සහනාධාර පොහොර නොමිලේ නිකුත් කරන බැවින් මෙම ගිණුම්වලින් ගනුදෙනු නොකළ බවත්, මේ වන විට එක් ගිණුමකින් පොහොර ගනුදෙනු සිදු කරන බවත්ය. | අක්‍රිය පොහොර ගිණුම් සම්බන්ධයෙන් සුදුස්සක් කළ යුතුය. |
| (ඇ) | ඕපනායක, මාරපන | වාරිමාර්ග නඩත්තු අරමුදලේ පැවති පිළිවෙලින් වර්ෂ 14කට | ඉදිරියේ දී මෙම මුදල සුළු වාරිමාර්ග අළුත්වැඩියා කටයුතු කිරීමට යොදාගන්නා | අරමුදල් හැකි ඉක්මනින් අවශ්‍ය කාර්යයන් සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | | වඩා පැරණි රු. 51,230ක ශේෂය හා වර්ෂ 05කට වඩා පැරණි රු. 278,250ක ශේෂය වාරිමාර්ග නඩත්තු කටයුතු හේතුවෙන් භාවිතා කර නොතිබුණි. | බවත් සහ මධ්‍යස්ථානය වෙත ලැබෙන දැනුවත් කිරීම් සහ දෙපාර්තමේන්තුවේ උපදෙස් හා අනුමැතිය මත එම මුදල් අදාළ වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යෙදවීමට පියවර ගන්නා බව. | භාවිතා කළ යුතුය. |
| (ඇ) | රත්නපුර | මධ්‍යස්ථාන පොහොර ගබඩාව තුළ කාබනික දියර පොහොර ලීටර් 118ක් පමණ ද, කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 7375ක් පමණ ද, වර්ෂ 02ක කාලයක සිට අභාවිතව පැවතිණි. | මෙම පොහොර තොගය නැවත රැගෙන යන ලෙස ලිඛිතව දැනුවත් කර ඇති බව. | අභාවිත තොග ආපසු යැවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | දාමහන | රු. 255,796ක හරිතාගාරය 2015 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවැතිණි. | අළුත්වැඩියා කිරීමට කමිටුව තීරණය කර ඇති බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය |
| (ඊ) | පල්ලෙබැද්ද, කහවත්ත | පිළිවෙලින් රු. 157,000ක් හා රු. 149,150ක් වූ පොහොර කැබලි කිරීමේ යන්ත්‍ර නිෂ්කාර්යව පැවැතිණි. | කාබනික පොහොර නිෂ්පාදන කටයුතු තාවකාලිකව නතර කළ බැවින් දැනට කිසිදු කාර්යයකට භාවිතා නොකරන බවත් ඉදිරියේ දී පොහොර නිෂ්පාදන කටයුතුවලට යොදා ගන්නා බවත්ය. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය |
| (උ) | තිඹොල්කැටිය | ට්‍රැක්ටරය 2020 වර්ෂයේ සිට අභාවිතව පවතී. | ට්‍රැක්ටරය සඳහා රියැදුරෙකු නොමැති බව දිස්ත්‍රික් කාර්යාලයට දැනුම් දී ඇති බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය |
| (ඌ) | කල්තොට | 2017 වර්ෂයේ ඉදිකළ රු. 64,000ක පැළ අලෙවි කුටිය, 2020 වර්ෂයේ ඉදිකළ රු. 219,745ක ගැමි බොජුන් හළ නිෂ්කාර්යව තිබුණි. | ඉදිරියේ දී භාවිතා කිරීමට අපේක්ෂා කරන බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ඇහැලියගොඩ, කළවාන, ඇලපාත, ගිලීමලේ, පොතුපිටිය, පනාමුර, තිඹොල්කැටිය, කිරිඇල්ල, අයගම | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් 141න් 2022 දෙසැම්බර් 31 දිනට වසම් 43ක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ පුරප්පාඩු පැවැතිණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට දිස්ත්‍රික් කාර්යාලය දැනුවත් කර ඇති බව. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

**4. ගොවිජන බැංකු**

| | කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | රත්මලවින්න, කොලොන්න, ඇහැලියගොඩ, කළවාන, ඇලපාත, ඕපනායක, ගොඩකවෙල, අම්බැවිල, ගිලීමලේ, රත්නපුර, පොතුපිටිය, වැලිගෙපොල, පනාමුර, දාමහන, පල්ලෙබැද්ද, තිඹොල්කැටිය, ඇඹිලිපිටිය, පඹහින්න, කිරිඇල්ල, කල්තොට, දොඩම්පෙ, නිවිතිගල, අයගම, කහවත්ත, පැල්මඩුල්ල, නාමල්දෙණිය, කුරුවිට, රාස්සගල | ණයලාභීන් 926 දෙනෙකුගෙන් 2022 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ශේෂය රු. 23,727,461ක්ව පැවැතිණි. | මුදල් අයකරමින් පවතින බවත්, ණයකරුවන්ට සිහිකැඳවීම් ලිපි යවා ඇති බවත්, දීර්ඝකාලීනව අයනොවන ශේෂ කපා හැරීම සඳහා ගොවිජන විනිශ්චය සභාව වෙත යොමු කිරීමත්, ඉතිරි ශේෂ සැලසුම්සහගතව අයකර ගැනීමට කටයුතු කරන බවත්ය. | හිඟහිටි ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රත්මලවින්න, කොලොන්න, ඇලපාත, ඕපනායක, ගොඩකවෙල, අම්බැවිල, ගිලීමලේ, | 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරිකිරීම් ගිණුම් 47277කින් ගිණුම් 27148ක් අක්‍රීය තත්ත්වයට පත් වී | ඉදිරියේ දී අක්‍රීය ගිණුම් සක්‍රීය කර ගැනීමටත්, ඉතිරි කිරීමේ නැඹියාව වර්ධනය කිරීමටත් | අක්‍රීය ගිණුම් සක්‍රීය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| රත්නපුර, පොතුපිටිය, වැලිගෙපොල, පනාමුර, දාමහන, පල්ලෙබැද්ද, තිඹොල්කැටිය, ඇඹිලිපිටිය, පඹහින්න, කිරිඇල්ල, කල්තොට, බඹරබොටුව, මාරපන, දොඩම්පෙ, නිවිතිගල, අයගම, කහවත්ත, පැල්මඩුල්ල, නාමල්දෙණිය, කුරුවිට, රාස්සගල | තිබුණි. | කටයුතු කරන බව. |